# ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ විකාශය

එස්.ඒ.ඩී.එම්. කල්හාර*

**සංක්ෂේපය**

ශ්‍රී ලංකාව දුරාතීතයේ පටන්ම විදේශිකයන්ගේ අවධානයට පාත්‍ර වූ රටකි. පිහිටීමේ ස්වභාවය අනුවම ශ්‍රී ලංකාවට එම අවධානය හිමි වූ බව උපකල්පනය කළ හැක. නාවුක ගමන් මාර්ගයක කේන්ද්‍රස්ථානයක පිහිටි දූපතක් වීම එයට හේතුවයි. වෙළඳ මධ්‍යස්ථානයක් වශයෙන් එකල ලොව පුරා ප්‍රචලිතව පැවති ශ්‍රී ලංකාවට ලොව විවිධ රට වලින් වෙළඳුන් පැමිණි බවට සාක්ෂි හමුවේ. වෙළඳාම සඳහා පමණක් නොව ශ්‍රී ලංකාවේ සුන්දරත්වය නැරඹීම සඳහාම විදේශිකයන් පැමිණ ඇති බව ඉබන් බතූතා, මර්කෝ පෝලෝ, පාහියන් හිමි ආදී විදේශිකයන්ගේ වාර්තා වලින් හෙළිවේ. ඔවුන් ශ්‍රී ලංකාවේ සුන්දරත්වය ඔවුන්ගේ වාර්තාවල වර්ණනා කර ඇති අතර, එසේ වාර්තා නොලියූ නමුත් මෙරටට සුන්දරත්වය නැරඹීමට පැමිණි තවත් විදේශිකයන් සිටින්නට ඇත. එමගින් හෙළිවන්නේ අතීතයේ පටන්ම සංචාරක ආකර්ෂණයක් වීමේ විභවතාව ශ්‍රී ලංකාවට පැවති බවයි. ශ්‍රී ලංකාව සංචාරක ආකර්ෂණයක් වශයෙන් විදේශිකයන් අතර ජනප්‍රියත්වයට පත්වීමට හේතු වූ ප්‍රධාන කරුණු 4 ක් හඳුනාගත හැකිය. එනම් දේශගුණය,ස්වභාවික පරිසරය,වෙරළ,පුරා විද්‍යා ස්ථාන හා සංස්කෘතිකාංග වශයෙනි.සංචාරක කටයුතු සම්බන්ධයෙන් අද පවතින ආකාරයේ අවධානයක් එකල නොතිබෙන්නට ඇති අතර 1930 දශකයේ සිට එය කර්මාන්තයක් වශයෙන් ආරම්භ වීමේ මූලික පියවර තබයි. ඉන් පසුව වර්තමානය වනවිට එය රටේ වැදගත් කර්මාන්තයක් බවට පත්ව තිබේ.

**හැඳින්වීම**

මෙහිදී ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ විකාශය පිළිබඳව අවධානය යොමු කෙරේ. ශ්‍රී ලංකාව තුළ සංචාරක කර්මාන්තය විකාශය වූ ආකාරය කාල පරිච්ඡේද කිහිපයක් යටතේ අධ්‍යයනය කළ හැකිය. එම කාල පරිච්ඡේද වෙන් වන්නේ සංචාරක කර්මන්තය සම්බන්ධයෙන් වැදගත් සිදුවීම් සිදුවූ කාල වකවානු වලදීය. ඒ අනුව නිදහස ලැබීමට පෙර කාලය,1948 සිට 1977 දක්වා කාලය,1972 සිට 1982 දක්වා කාලය,1982 සිට 1992 දක්වා කාලය,1992 සිට 2007 දක්වා කාලය,2007 න් පසු කාලය වශයෙන් එම කාල පරිච්ඡේද වෙන් කළ හැකිය. ඒ අනුව මෙම කාල පරිච්ඡේද ඔස්සේ ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ විකාශය පිළිබඳව සාකච්ඡා කල හැකිය.

**ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ විකාශය**

**නිදහස ලැබීමට පෙර කාලය**

ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයට පදනම සකස් වන්නේ බ්‍රිතාන්‍ය යටත් විජිතයක්ව පැවති යුගයේදීය. 1930 දශකය එහිදී වැදගත් වේ. පෙර අපර දෙදිග යා කල නාවුක ගමන්

* *තාවකාලික ප්‍රදර්ශක, සමාජීයවිද්‍යා පීඨ පරිගණක විද්‍යාගාරය, dmkalhara@gmail.com*

මාර්ග වල කේන්ද්‍රස්ථානයක පැවතීම නිසා කොළඹ වරාය නිතැතින්ම නැව් වලට නැවතුම්පොළක් වී තිබුණි. එබැවින් එංගලන්තයේ සිට ඕස්ට්‍රේලියාවටත් ඈත පෙරදිග රටවලටත් ගමන් කළ නෞකාවලින් ශ්‍රී ලංකාවට ගොඩ බසින ලද යුරෝපීයන්ගේ අවධානය ශ්‍රී ලංකවේ සුන්දරත්වයට යොමු විය. විශේෂයෙන්ම ශ්‍රී ලංකවේ නිරිත දිග කලාපයේ පිහිටි හිරු රැසින් නැහැවුණු මුහුදු වෙරළ තීරය ඔවුන්ගේ ප්‍රධාන ආකර්ෂණය බවට පත්වී තිබුණි. එම වකවානුව වනවිට ශ්‍රී ලංකාවට නැව් වලින් ගොඩ බැසි සංචාරකයන්ගෙන් වසරකට දෙලක්ෂයත් හාරලක්ෂයත් අතර ප්‍රමාණයක් දිවයිනේ අවම වශයෙන් එක් රැයක්වත් ගතකිරීම සිදු විය.

ඒ අයුරින් සිදුවූ සංචාරක ආගමනය නිසා සංචාරකයන්ට අවශ්‍ය පහසුකම් සැලසීමට යටත් විජිත ආණ්ඩුව උත්සුක විය. ඒ අනුව එයට මූලාරම්භය වශයෙන් 1937 දී රජයේ දේශ සංචාර කාර්යංශය (Govt. Tourism Bureau) පිහිටුවීමට පියවර ගන්නා ලදී. එය ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ ආරම්භක අවස්ථාව වශයෙන් හඳුනාගත හැකිය.

එම කාර්යංශය ආරම්භ කිරීමෙන් ආර්ථික ක්‍රියාවලියක් ලෙස සංචාරක කර්මාන්තය ශ්‍රී ලංකාවේ සංවර්ධනය කිරීමේ අරමුණක් යටත් විජිත ආණ්ඩුවට නොවීය. එහි ප්‍රධාන අරමුණ වූයේ යුරෝපයෙ සිට පැමිණි සංචාරකයන්ට අවශ්‍ය මූලික පහසුකම් සැලසීමයි. ලංකාවේ පැරණිම තානයම් වන හික්කඩුව, වැලිගම, අඹේපුස්ස, සීගිරිය, බෙලිහුල් ඔය, ඇල්ල ආදී තානායම් සංචාරකයන් නිතර ගමන් ගත් මාර්ග ආශ්‍රිතව පිහිටුවීම සිදුවනේ ඒ අනුව ය.

1942 වර්ෂය වනවිට දෙවන ලෝක සංග්‍රාමය ආරම්භ වීම නිසා සංචාරකයන්ගේ පැමිණීම අඩු වු අතර එම නිසාම රජයේ දේශ සංචාරක කර්යංශයේ වැඩ කටයුතු ද නවතා දැමීමට සිදු විය. දෙවන ලෝක සංග්‍රාමය කාලයේ දී ආසියවේ මිත්‍ර හමුදාවල අණදීමේ මුලස්ථානය ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබු අතර එබැවින් විවිධ රටවලින් පැමිණි මිත්‍ර හමුදාවල සොල්දාදුවන් රඳවා සිටි ස්ථාන බවට කොළඹ, කටුනායක, පේරාදෙණිය, දියතලාව හා ත්‍රිකුණාමලය පත් විය. පසුකාලීනව සංචාරක ආකර්ෂණයක් වශයෙන් ශ්‍රී ලංකාව ලොව පුරා ප්‍රචාරය වීමට ද මෙය ප්‍රයෝජනවත් විය. දෙවන ලෝක සංග්‍රාමයෙන් පසුව බ්‍රිතාන්‍යය තම යටත් විජිත වලට ස්වාධීනත්වය ප්‍රදානය කළ අතර ඒ අනුව 1948 දී ශ්‍රී ලංකාවට නිදහස හිමි විය (පතිරණ, 2010).

**1948 සිට 1977 දක්වා කාලය**

නිදහස ලැබීමෙන් පසුව නැවතත් ශ්‍රී ලංකාවට සංචාරකයන් ඇදී ඒමේ ප්‍රවණතාවයක් දක්නට ලැබුණු නිසා යටත් විජිත සමයේ පිහිටුවා තිබූ දේශ සංචාරක කාර්යංශය නැවත පණ ගැන්වීමට තීරණය කරන ලදී. ඒ අනුව 1953 දී රජයේ දේශ සංචාරක කාර්යංශය කොළඹ ජැටියේදී නැවතත් පිහිටුවීය. ඒ වනවිට නැව්වලින් වසරකට තාවකාලික දෛනික අමුත්තන් 79,000 ක් පමණ කොළඹ වරායට ගොඩ බැසි හෙයින් ඔවුන්ට සේවා සැපයීම සඳහා බලපත්‍ර සහිත සංචාරක මාර්ගෝපදේශන සේවාවක් හා ජැටියේ කුළී රථ සේවාවක් ආරම්භ කිරීමට රජයේ දේශ සංචාරක කාර්යංශය ක්‍රියා කල අතර හොටෙල් කාමර 650ක් පමණ සංචාරකයන්ට නවාතැන් ගැනීමට සුදානම්ව පැවතිණි.

1950 වනවිට ලොව පුරා සංචාරය කරන ප්‍රමාණය ශීඝ්‍ර වර්ධනයක් ඇතිවූ අතර එයට හේතුවූ වුයේ දෙවන ලෝක යුද්ධයෙන් පසුව මගී ප්‍රවාහනය සඳහා ජෙට් ගුවන් යානා හඳුන්වාදීමයි. මේ වනවිට රටවල් අතර ප්‍රධාන ප්‍රවාහන මාධ්‍ය බවට ගුවන් යානා පත්වූ අතර බොහෝ රටවල් තම ගුවන් තොටුපොළවල් වැඩිදියුණු කිරීමට ආයෝජනය කළ ද ශ්‍රී ලංකාව එම ආයෝජනය සිදු නොකළ නිසා පෙරදිග හා අපරදිග අතර ප්‍රධාන ගුවන් දොරටුව වීමේ අවස්ථාව ශ්‍රී ලංකාවට අහිමි විය. එම අවස්ථාව හිමිකරගන්නේ සිංගප්පූරුවයි. කටුනායක ගුවන් තොටුපොළ ක්‍රියාත්මක වීම ආරම්භ වුයේ 1965දී වන අතර නව මගී පර්යන්තය 1968 මාර්තු මාසයේ දී විවෘත කෙරිණි. (www.sltda.lk).

1960 දශකය පමණ වනවිට ශ්‍රී ලංකාවට ආර්ථිකමය ගැටළු රාශියකට මුහුණ පෑමට සිදු විය. නිදහස ලබන විට හිමිව තිබූ යහපත් විදෙස් සංචිතය අඩු වීමත් විදේශ විනිමය ඉපැයූ තේ, පොල්, රබර්, වැනි අපනයන බෝග වල මිල අඩුවීමත් එයට හේතුවයි. තවද නිදහස් අධ්‍යාපනයේ ආරම්භය නිසා අධ්‍යාපනය ලබා පාසල් වලින් පිටවූ රැකියා විරහිත තරුණයන් රාශියක් ද රට තුළ විය. එබැවින් විදේශ විනිමය ඉපැයීමේ විකල්ප මාර්ගයක් ලෙසත් රැකියා ප්‍රශ්නයට විසඳුමක් ලෙසත් සංචාරක කර්මාන්තය තවදුරටත් සංවර්ධනය කිරීමට එවක රජය ක්‍රියාකරන ලදී. මෙහි ප්‍රතිඵලයක් ලෙස මෙතෙක් අවිධිමත්ව පවත්වාගෙන ආ සංචාරක ව්‍යාපාරය සැලසුම් සහගතව සංවර්ධනය කිරීමේ පරමාර්ථයෙන් 1966 අංක 10 දරණ ලංකා සංචාරක මණ්ඩල පනත මගින් 1966 මැයි මස 1 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලය පිහිටුවන ලදී. එය ශ්‍රී ලංකාව සංචාරක කර්මාන්තයට සැලසුම්සහගතව පිවිසීමේ ප්‍රථම පියවර විය. එයට සමගාමීව 1966 අංක 14 දරණ ලංකා හොටෙල් සංස්ථා පනත මගින් ලංකා හොටෙල් සංස්ථාව ද පිහිටුවීය.

තවද සංචාරක කර්මාන්තයේ උන්නතිය උදෙසා දීර්ඝ කාලීන සංචාරක සැලැස්මක් සකස් කිරීමේ අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන 1967 - 1976 දස අවුරුදු සංචාරක සැලැස්ම සකස් කළ අතර එය සකස් කරන ලද්දේ Harris Kerr Foster ආයතනය විසින්ය. එමගින් ශ්‍රී ලංකාව සංචාරක කලාප 5ක් යටතේ සංවර්ධනය කිරීම අරමුණ විය.

ලංකා සංචාරක මණ්ඩලය ස්ථාපනය කරනු ලැබූ අතර එහි කටයුතු උදෙසා අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන සැලසීම වෙනුවෙන් 1968 අංක 14 සංචාරක සංවර්ධන පනත සම්මත කරන ලද අතර එමගින් ශ්‍රී ලංකාවේ සියළුම සංචාරක සේවා හා පහසුකම් විධිමත් ප්‍රවාහයකට ගෙන ඒමේ නීතිමය බලය ලංකා සංචාරක මණ්ඩලයට පවරා දෙන ලදී. එසේම එම පනත මගින් සංචාරකයන් සඳහා ගුණාත්මක හා උසස් ප්‍රමිති තත්වයේ සේවාවක් සහතික කිරීම, විවිධ විෂමාචාරයන්ගෙන් සංචාරකයන් ආරක්ෂා කර ගැනීම පදනම් කරගෙන නීති සංග්‍රහ 5ක් ද හඳුන්වා දෙන ලදී. ඒ

- සංචාරක හොටෙල් නියෝග සංග්‍රහය.
- චාරිකා නියෝජිතවරුන්ගේ නියෝග සංග්‍රහය.
- විශේෂිත සංචාරක සේවා නියෝග සංග්‍රහය.
- සංචාරක මර්ගෝපදේශක කථිකාචාර්‍යවරුන්ගේ නියෝග සංග්‍රහය.

- මහාමාර්ග හා දර්ශනීය ස්ථාන ආරක්ෂා කිරීමේ හා සුන්බුන් අංගන පාලනය කිරීමේ නියෝග සංග්‍රහය ලෙසයි.

මෙම වෙනස්කම් නිසාම ශ්‍රී ලංකාවට පැමිණි සංචාරකයන්ගේ සංඛ්‍යාව ඉහළ ගිය අතර 1970 දී පැමිණි සංචාරකයන්ගේ සංඛ්‍යාව 46,247 ක් විය. දෛනික අමුත්තන් 68,524 ක් ද පැමිණ තිබුණි. 1971 වර්ෂයේ ඇතිවූ තරුණ කැරැල්ල ශ්‍රී ලංකාවට පැමිණි සංචාරකයන්ගේ සංඛ්‍යාව 39,654 දක්වාත් දෛනික අමුත්තන්ගේ සංඛ්‍යාව 58,292 දක්වාත් පහළ දැමීමට හේතු විය. 1976 වර්ෂයේ නොබැඳි ජාතීන්ගේ සමුළුව ශ්‍රී ලංකාවේ පැවති අතර එහි සභාපතීත්වය ද ශ්‍රී ලංකාවට හිමිවිය. එය ශ්‍රී ලංකාවට ජාත්‍යන්තර වශයෙන් ප්‍රචාරයක් ලැබීමට ද ඉවහල් වූ අතර එම වර්ෂයේ දී පැමිණි සංචාරකයන්ගේ සංඛ්‍යාව 118,971 දක්වා ඉහළ ගොස් තිබේ (පතිරණ, 2010).

**1977 සිට 1982 දක්වා කාලය**

1977 සිට නව දේශපාලන හා ආර්ථික රටාවක් ශ්‍රී ලංකාවේ ආරම්භ විය. එවක රජය විසින් විවෘත ආර්ථිකය හඳුන්වා දීම නිසා සංචාරක කර්මාන්තය උදෙසා පෞද්ගලික අංශය ආයෝජනය කිරීමට පෙළඹීම ද සිදු විය.

තවද සංචාරක කර්මාන්තයේ වැදගත්කමත්, ජාත්‍යන්තර ප්‍රවණතාවයන් ද සැලකිල්ලට ගෙන 1978 දී සය අවුරුදු සංචාරක සැලැස්මකට යොමු වීම ද සිදුවිය. 1978 - 1984 සංචාරක සැලසුම මගින් සංචාරකයන්ගේ පැමිණමත්, ඉපැයීම් ප්‍රමාණයත්, හොටෙල් කාමර සංඛ්‍යාවත් වර්ධනය කිරීමට සැලසුම් කෙරිණි. ටාජ් සමුද්‍රා හෝටලය, ගලදාරි හෝටලය, සිලෝන් ඉන්ටකොන්ටිනෙන්ටල් හෝටලය, ඔබෙරෝයි හෝටලය, හිල්ටන් හෝටලය, රමාඩා හෝටලය වැනි ජාත්‍යන්තර ඇඳුනු හොටෙල් ආරම්භ කිරීමට විදෙස් ආයෝජකයන්ට අවස්ථාව සලසා දුණි. ඒ අනුව 1977 දී ඇඳන් 9447 සහිතව පැවති 4871 ක් වූ සංචාරක හොටෙල් කාමර සංඛ්‍යාව 1983 වන විට ඇඳන් 17605ක් සහිත සංචාරක හොටෙල් කාමර 8852 ක් දක්වා ඉහළ ගිය අතර 1982 වර්ෂය අවසානයේ ශ්‍රී ලංකවට පැමිණි සංචාරකයන්ගේ සංඛ්‍යාව 407,230 ක් හා සංචාරක ඉපැයීම් ප්‍රමාණය ඇමරිකානු ඩොලර් මිලියන 146.6 දක්වාත් ඉහළ ගොස් තිබුණි. එබැවින් මෙම වකවානුව ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ ස්වර්ණමය යුගයක් වශයෙන් හඳුනාගත හැකිය.

**1982 සිට 1992 දක්වා කාලය**

මෙම කාලවකවානුව ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයට අඳුරු කාල පරිච්ඡේදයක් විය. 1983 දූ එල්.ටී.ටී.ඊ ත්‍රස්තවාදී සංවිධානය විසින් ශ්‍රී ලංකාවේ සෙබලුන් 13 දෙනෙකු ඝාතනය කිරීම නිසා පැන නැගි සිවිල් ගැටුම එම අඳුරු කාල පරිච්ඡේදයේ ආරම්භය සනිටුහන් කරයි. එතැන් පටන් දශක තුනකට ආසන්න කාලයක් පැවති ත්‍රස්තවාදී උවදුර ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයෙන් උපරිම ප්‍රයෝජන ලබා ගැනීමට සීමා කර තිබුණි. එසේම 1988 සහ 1989 කාල වලදී පැනනැගි සිවිල් අරගල හේතුවෙන් සංචාරකයන්ගේ සුරක්ෂිතභාවය සම්බන්ධයෙන් ඇතිවූ ගැටලු නිසා හා මානව හිමිකම් උල්ලංඝනය කිරීම

පිළිබඳ ඇතිවූ අයහපත් ප්‍රතිරූපය තවදුරටත් ශ්‍රී ලංකාවට පැමිණි සංචාරකයන්ගේ ප්‍රමාණය පහළ දමන ලදී.

ඒ අනුව 1984 දී 257,458 ක්, 1985 දී 317,734 ක්, 1987 දී 182,662 ක් හා 1988 දී 182,662ක් වශයෙන් සංචාරක පැමිණීම පහත වැටුණි. 1990 - 1991 වන විටත් යළිත් පැමිණෙන සංචාරකයන්ගේ සංඛ්‍යාව 400,000 කරා ගෙන ඒම දුෂ්කරකටයුත්තක් විය. නමුත් නැවතත් දස අවුරුදු සංචාරක සැලැස්මක් වෙත යාමට ලෝක සංචාරක සංවිධානයේ හා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ අනුග්‍රහකතවය 1990 අග භාගය වනවිට ශ්‍රී ලංකාවට හිමි විය.

**1992 සිට 2007 දක්වා කාලය**

1992 - 2001 දක්වා කාල සීමාවට එම දස අවුරුදු සැලැස්ම සකස් කර තිබූ අතර එමගින් පහත ඉලක්කයන් වෙත ළඟාවීම අරමුණ විය.

| | 1981 | ඉලක්ක | |
|---|---|---|---|
| | ( පැවති තත්වය ) | 1996 | 2001 |
| ගුවන් මගින් ලංකාවට පැමිණෙන සංචාරක සංඛ්‍යාව | 317,703 | 528,500 | 874,200 |
| ගත කරනු ලබන රාත්‍රී දින ගණන | 3.6 | 5.5 | 8.2 |
| සංචාරක ඉපැයීම් ඇ.ඩො.මි | 156 | 312 | 706 |
| හොටෙල් කාමර සංඛ්‍යාව | 9,679 | 14,365 | 18,953 |
| රැකියා නියුක්තිය | 64,507 | 91,238 | 136,574 |
| නැව් මගින් පැමිණෙන සංචාරක සංඛ්‍යාව | - | - | 100,000 |

**1 වගුව**

**1992 - 2001 දස අවුරුදු සැලැස්මේ ඉලක්ක**

මූලාශ්‍රය : සංචාරක මහා සැලැස්ම 1992-2001

1994 වසරේ නව රජයක් බලයට පත් වීමත් සමග එම සැලැස්ම ක්‍රියාත්මක වීම අඩපණ විය. 1996 වසරේදී කොලඹ මහ බැංකුවට එල්ල වූ ත්‍රස්තවාදී ප්‍රහාරය නිසා 1995 දී 403,511 දක්වා වර්ධනය වී තිබූ සංචාරක පැමිණීම 1996 දී 302,265 ක් දක්වා පහත වැටුණි. නැවත එය 400,000 ඉක්ක්මවන්නේ 1999 වර්ෂයේදීය.ඒ 436,440 ක් ලෙසයි. 2001 වසරේ දී කටුනායක ජාත්‍යන්තර ගුවන්තොටුපලට එල්ල වූ ත්‍රස්තවාදී ප්‍රහාරය සංචාරක ව්‍යාපාරයට දැඩි ඍණාතමක බලපෑමක් ඇති කරන ලදී. එම වසරේ සැප්තැම්බර් 11 වන දින ඇමරිකාවේ ලෝක වෙළඳ මධ්‍යස්ථානයට එල්ල වූ ත්‍රස්තවාදී ප්‍රහාරය ජාත්‍යන්තර සංචාරක කර්මාන්තයට තර්ජනයක් විය. ඒ අනුව 2001 අවසානය වනවිට ශ්‍රී ලංකාවට පැමිණි සංචාරක සංඛ්‍යාව 336,794 දක්වා නැවතත් පහළ වැටුණි.

2002 දී පැවති මැතිවරණයෙන් බලයට පත් වූ නව රජය ත්‍රස්තවාදීන් සමග සාම සාකච්ඡා ඇරඹී හෙයින් යම් ආකාරයක සාමකාමී වාතාවරණයක් රට තුළ ගොඩ නැංවුණු අතර එය සංචාරක පැමිණීම 506,642 ක් දක්වා ඉහළ දැමීමට සමත් වු අතර 2004 දී එය 566,202 ක් ලෙස වාර්ථා වේ. 2004 වසරේ දෙසැම්බර් මාසයේදී ඇතිවු සුනාමි ව්‍යසනය නිසා 2005 පැමිණි සංචාරක සංඛ්‍යාව 549,308 දක්වා යම් පහළ යාමක් සිදුවී තිබුණි.

නැවතත් 2005 දී රටේ නව ජනාධිපතිවරයෙක් පත් වීමෙන් පසු කොටි ත්‍රස්තවාදීන් සමග අත්සන් කර තිබූ අවබෝධතා ගිවිසුම කඩ කිරීමට ත්‍රස්තවාදීන් ක්‍රියා කළ අතර රට තුළ ත්‍රස්තවාදී ක්‍රියා ද ඉහළ යාමක් සිදු විය. රටක පවතින එවැනි අනතුරුදායක තත්වයක් යටතේ සංචාරකයන් පැමිණීම අනිවර්යයෙන්ම අඩුවන බැවින් 2007 දී 495,008 ක් දක්වා පහළ වැටුණි. 2005 වසරේදී පාර්ලිමේන්තුවේ සම්මත වූ නව සංචාරක පනත ක්‍රියාත්මක වන්නේ 2007 වසරේ සිටයි.

**2007 න් පසු කාලය**

2005 අංක 38 දරණ සංචාරක කටයුතු පනත මගින් ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය සම්බන්ධයෙන් ප්‍රමුඛ ආයතනය වු ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලය 2007 ඔක්තොම්බර් 01 දින සිට ප්‍රතිව්‍යුහගතකරණයට ලක් කෙරිණි. ඒ අනුව එම ආයතනය වෙනුවට සමස්ත ශ්‍රී ලාන්කේය සංචාරණයේ බලධාරී ආයතන 4 ක් ස්ථාපිත කෙරිණි. ඒවා නම්,

- ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය. (Sri Lanka Tourism Development Authority)
- ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යංශය. (Sri Lanka Tourism Promotion Bureau)
- ශ්‍රී ලංකා සංචාරක හා හොටෙල් කළමනාකරණ ආයතනය. (Sri Lanka Institute of Tourism & Hotel Management)
- ශ්‍රී ලංකා සම්මේලන කාර්යංශය. (Sri Lanka Convention Bureau)

1983 සිට රටේ සියළුම කටයුතු වලට බාධාවක් ව පැවති ත්‍රස්තවාදී උවදුර මුළුමනින්ම අවසන් කිරීමට 2009 වසරේදී මහින්ද රාජපක්ෂ ජනාධිපතිගේ සේනාධි නායකතවයෙන් යුතු ත්‍රිවිධ හමුදාවන්ට හැකි විය. ඒ සමගම රටේ සියළුම අංශ මෙන් සංචාරක කර්මාන්තයටද යහපත් කාලයක් උදා වී තිබේ. 2009 දී 447,890 ක් වු සංචාරක පැමිණීම 2010 වනවිට 654,476 ක් දක්වා ශ්‍රීඝ්‍රව වර්ධනය වීමෙන්ම එම තත්වය පැහැදිලි වේ. 2011 දී එය තවදුරටත් 855,975 දක්වා ඉහළ ගියේ ය.

| වර්ෂය / කලාපය | 2005 | 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2011 |
|---|---|---|---|---|---|---|---|
| උතුරු ඇමරිකානු | 46,727 | 35,688 | 28,338 | 23,203 | 25,044 | 40,552 | 53,658 |
| ලතින් ඇමරිකානු හා කැරිබියන් | 732 | 805 | 4,004 | 3,721 | 666 | 594 | 11,673 |
| බටහිර යුරෝපය | 227,558 | 228,666 | 195,813 | 165,822 | 170,186 | 255,172 | 20,431 |
| නැගෙනහිර යුරෝපය | 9,305 | 4,236 | 25,485 | 29,352 | 26,177 | 35,630 | 51,922 |
| මැද පෙරදිග | 10,230 | 10,191 | 13,587 | 16,701 | 23,821 | 37,501 | 36,376 |
| අප්‍රිකාව | 2337 | 2,163 | 2,991 | 2,354 | 1,561 | 2,249 | 6,736 |
| ආසියාව | 222,844 | 241,954 | 200,697 | 175,944 | 174,582 | 245,753 | 354,274 |
| ඕස්ට්‍රේලියාව | 29,575 | 24,900 | 22,993 | 21,378 | 26,023 | 37,025 | 51,411 |
| එකතුව | 549,308 | 559,603 | 494,008 | 438,475 | 447,890 | 654,476 | 855,975 |

**2 වගුව**

**කලාපීය වශයෙන් ශ්‍රී ලංකාවට පැමිණි සංචාරකයන් ප්‍රමාණයන් (2005 - 2011)**

මූලාශ්‍රය: Sri Lanka Tourism Development Authority Statistical Report, 2011

Lonely Planet සඟරාව සඳහන් කරන්නේ 2013 වසරේ සංචරණයට සුදුසුම රට ශ්‍රී ලංකාව බවයි. එහිදී එම සඟරාව ශ්‍රී ලංකාව අනන්ත වූ මුහුදු වෙරළකින්, කාලයක් නැති නටඹුන් වලින්, ආගන්තුක සත්කාරයට ලැදි මිනිසුන්ගෙන්, විශාල ප්‍රමාණයක් වූ අලින්ගෙන් සමන්විත වන, ත්‍රාසජනක ලෙස සර්ෆ් ක්‍රීඩාවේ නියැලිය හැකි, විනෝදාත්මකව දුම්රියේ යා හැකි, තේ වලට ප්‍රසිද්ධ, රසවත් ආහාර ඇති රටක් වශයෙන් හඳුන්වයි. එම හැඳින්වීම තුළම ශ්‍රී ලංකාවට සංචාරක ආකර්ෂණයක් වශයෙන් ඇති විභවතාවය මනාවට පැහැදිලි වේ.

| රට | 2012 ජන - නොවැ | 2013 ජන - නොවැ | වර්ධනය % |
|---|---|---|---|
| ඉන්දියාව | 157395 | 171675 | 9.1 |
| බ්‍රිතාන්‍ය | 101357 | 111184 | 9.7 |
| ප්‍රංශය | 51312 | 56106 | 9.3 |
| ඔස්ට්‍රේලියාව | 41627 | 43965 | 5.6 |
| චීනය | 22176 | 40281 | 81.6 |
| රුසියාව | 24005 | 34973 | 45.7 |
| ඇමරිකාව | 26251 | 30692 | 16.9 |

**3 වගුව**

**ශ්‍රී ලංකාවට වැඩිම සංචාරකයින් පැමිණීම වාර්තාකල රටවල්**

මූලාශ්‍රය :- ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

2013 වර්ෂයේ දී විදෙස් සංචාරකයන් ප්‍රමානය 1016228 විය. ඒ අනුව 2013 ජනවාරි සිට නොවැම්බර් දක්වා කාලය තුල විදෙස් සංචාරකයින් පැමිණීම 15 % වැඩි වී ඇත. එමෙන්ම 2014 වර්ෂයේ දී ලංකාවට පැමිණි සංචාරකයන් ප්‍රමාණය 1527153 කි. ඒ අනුව නැගී එන ආර්ථිකය තුල ශ්‍රී ලංකාව සංචාරක ආකර්ශනීය රටක් බවට පත් කරලමින් 2014 වර්ෂයට සාපේක්ෂව 2015 දී විදෙස් සංචාරකයින් පැමිණීම 18.1 % කින් වර්ධනය විය. ඒ අනුව 2015 වර්ෂය තුල චීනය, ඉන්දියාව, ප්‍රංශය වැනි රටවලින් කැපී පෙනෙන සංචාරකයින් ප්‍රමාණයක් ලංකාවට පැමිණ තිබේ.

**නිගමනය**

මේ අනුව ශ්‍රී ලංකාවට සංචාරක ආකර්ෂණයක් වශයෙන් ඇති විභවතාවය මනාවට පැහැදිලි වන රටක් වන අතර 2016 වර්ෂයේ විදේශ සංචාරකයින් ලක්ෂ 25 ක් ගෙන්වා ගැනීමට අපේක්ෂා කරන අතර ම රජය විසින් ඒ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය සඳහා මග පෙන්වීම අත්‍යවශ්‍ය කරුණකි. මෙහිදී රටක් වශයෙන් සංචාරක ඉලක්ක ජයගැනීමෙදී පැමිණෙන සංචාරකයින් ප්‍රමාණය මෙන්ම සංචාරක ඉපැයුම්ද වැදගත් වේ. සංචාරක ඉපැයුම් අඛන්ඩව වර්ධනය වීමට නම් සංචාරකයින්ගේ පැමිණීම් වල වර්ධනය ඉතාම වැදගත් වේ. මෙහිදී වැදගත් වන්නේ සංචාරකයින් පැමිණීමේ ඉලක්ක සපුරාගැනීමේ හැකියාවන් උපරිම ප්‍රයෝජන ගනිමින් රජය සංචාරක ඉලක්ක ජයගැනීමට සමත් වැඩපිලිවෙලක් සකස් කිරීමයි.

**ආශ්‍රිත මූලාශ්‍රය**

පතිරගේ, පොඩිමැණිකේ (2011), *සංවර්ධන ආර්ථික විද්‍යාව න්‍යායන් හා සංකල්ප*, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

පතිරණ, යූ.පී.එස්. (2010), *සංචාරක ව්‍යාපාරය පසුබිම බලපෑම් හා ප්‍රවණතා*, සූර්ය ප්‍රකාශන, කොළඹ.

ගනේවත්ත, නුවන් සහ වික්‍රමරත්න, පැතුම් (2012), *ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරය අනාගත අපේක්ෂා සහ අභියෝග*, ශාක්‍ය ප්‍රකාශන, කොළඹ.

*සංචාරක මහා සැලැස්ම 1992-2001*

*Annual Statistical Report*, 2011 Sri Lanka Tourism Development Authority.

*Annual Statistical Report*, 2014 Sri Lanka Tourism Development Authority.

*Tourism Highlights 2012 Edition*, UNWTO

Travel & Tourism: Economic Impact 2012 World, World Travel & Tourism Council.

www.sltda.lk

www.wttc.org